රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි:- 05/2022

මගේ අංකය:-EST-7/UNIFO/06/V
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.09.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රජයේ නිලධරයන්ගේ ඇඳුම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2019.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2019 (I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛයේ 03 ඡේදයෙහි I යටතේ, "රජයේ නිලධරයන් රාජකාරී වේලාව තුල ස්වකීය කාර්යාල පරිශ්‍රයට පැමිණීමේ දී පිරිමි නිලධරයන් කලිසම හා කමිසය හෝ ජාතික ඇඳුමින් සැරසී සිටිය යුතු අතර කාන්තා නිලධාරිනියන් සාරිය, ඔසරිය හෝ රාජ්‍ය සේවයේ ගෞරවය රැකෙන සුදුසු සංවරශීලී ඇඳුමකින් සැරසී පැමිණිය යුතු වේ." ලෙසට අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් විධිවිධාන හඳුන්වා දී ඇත.

03. එසේ චක්‍රලේඛ විධිවිධාන හඳුන්වා දී තිබියදී, නිලධාරිනියන්ට ස්වකීය කාර්යාල පරිශ්‍රයන් තුලට පැමිණීමේදී ඇඳුම් ලෙස සාරිය හෝ ඔසරිය පමණක් භාවිතා කරන ලෙසට ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් නියම කරනු ලබන අවස්ථා පවතින බව වාර්තා වී ඇත.

04. රජයේ නිලධරයන් ස්වකීය කාර්යාල පරිශ්‍රය වෙත පැමිණීමේදී හා රාජකාරියෙහි යෙදී සිටියදී රාජ්‍ය සේවයේ ගෞරවය රැකෙන ආකාරයේ සුදුසු කාර්යාලීය ඇඳුමකින් සැරසී සිටීමට ඉඩදිය යුතුය. තවද, එය ක්ෂේත්‍ර රාජකාරී සඳහා ද අදාළ විය යුතුය.

05. රජයේ නිලධරයකු පාර්ලිමේන්තුව, අධිකරණය, ජාතික හෝ ජාත්‍යන්තර උත්සව හෝ සම්මන්ත්‍රණ ආදී විශේෂ අවස්ථාවකට සහභාගී වීමේදී ජාතික ඇඳුම හෝ නියම කර ඇති ඇඳුමෙන් සැරසී ඒ සඳහා සහභාගී විය යුතුය.

06. 2019.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2019 (I) හි විධිවිධාන නොවෙනස්ව පවතී.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2695738
ෆැක්ස් : 011-2695279
විද්‍යුත් ලිපිනය : pubad.secretary@sltnet.lk